# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2471/09 – 2026 ජනවාරි මස 12 වැනි සඳුදා – 2026.01.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මැයි මස 14 වැනි දින අංක 1810/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 141 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: LD/05/2008/HW/97-II.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
DSM/YT/LAND/මා/1612/18.

2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය 1**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E337B, ඩන්ගන් පෙදෙස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඩන්ගන් පෙදෙස ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.මා. 1612 හි කැබලි අංක 23 ප්‍රමාණයෙන් (පර්. 9.2) ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 23 – ඩන්ගන්වත්ත – ප්‍රමාණය: පර්. 9.2**

උතුරට: මු.පි.මා. 314 හි කැබලි අංක 1; නැගෙනහිරට: මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය, කැබලි අංක 19 සහ 24; දකුණට: කැබලි අංක 19, 24, 17 සහ මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය; බටහිරට: සී. කේ. ගමලත් හිමිකම් කියන ඩන්ගන්වත්ත සහ මු.පි.මා. 314 හි කැබලි අංක 1.

EOG 01 – 0112

1A – G 046069 – 08 (2026/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*